

# සිංහල

# ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

සිංහල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සඳහා
යෝජනාවලිය

# වර්ෂ 1972 සිට පැවති ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවල ප්‍රතිපලය

හෙල - රාවන යුගයේ විසූ යක්ෂ, නාග, රාක්ෂස හා දේව යන ගෝත්‍ර සතර එක්සේසත් කොට ශාක්‍ය වංශික ආර්ය සිංහල පණ්ඩුකාභය රජතුමා විසින් සම්මත වර්ෂ යට 437 දි ස්ථාපිත කරන ලද සිංහල රාජ්‍යය වසර 2300කට අධික කාලයක් සාර්ථකව පැවත වර්ෂ 1815 දි අවසන් විය. ඉන්පසුව සිංහල ජාතියට ඓතිහාසිකව තිබු සිංහල රාජ්‍ය පාලන සහ ජාතිකත්ව අයිතිය ද අහිමි කරන ලදි. ඉංග්‍රිසි පාලන යුගයේ දි සහ වර්ෂ 1948 සිට අද දක්වා මෙරට භූමියට නිශ්චිත උරුමක්කාර ජාතියක් නැති, හුදෙක් පුරවැසියන් පමණක් ඇති රාජ්‍යයක් බවට පත්ව ඇත්තේ ඉංග්‍රීසි පාලකයන්ගේ ජනකොට්ඨාශ බෙදා වෙන් කොට පාලනය කිරීමේ රාජ්‍ය පාලන ක්‍රමය නිසාය. එම රාජ්‍යය තුළ විවිධ ජනකොට්ඨාශ පොදු ප්‍රගතියක් පිණිස කටයුතු කිරීම වෙනුවට, තම තමන්ගේ ජනකොට්ඨාශයේ ප්‍රගතිය උදෙසා කටයුතු කරයි. සිංහලයන් දේශපාලනිකව බෙදි ජාතිය වෙනුවට දෙපිළක පක්ෂ ආරක්ෂා කරයි.

වසර 2300කට අධික කාලයක් ඉතාම සාර්ථකව රාජ්‍යයක් පැවතියේ මෙරට ශිෂ්ටාචාරය ගොඩ නගන ලද සිංහල ජාතියට, සිංහල භාෂාවට, සිංහල සංස්කෘතියට සහ සිංහල ජාතික අනන්‍යතාවයට එකල විසූ සියළුම ජනකොට්ඨාශවල පොදු එකඟතාවයක් එදා තිබු නිසාය. එහෙත් ඉංග්‍රිසි පාලකයන් විසින් එම තත්වය 1815 දි අවසන් කොට සියළු ජනකොටස්වලට ඉංග්‍රීසි පාලනය තුළ සම අයිතිය ඇතය යන ව්‍යාජ සංකල්පයක් යටතේ අධිරාජ්‍ය පාලනයක් ස්ථාපිත කරන ලදි. ඉන්පසුව ඉංග්‍රිසි ස්වාමි පාලකයාගේ පාලන ක්‍රමයට අභියෝග කිරීමට නොහැකිව සෙසු ජනකොට්ඨාශ එම ක්‍රමය තුළ කොතරම් අසාධාරණකම් පැවතිය ද ඒවා විඳ දරාගෙන සිටින ලදි.

වර්ෂ 1815 සිට ඉංග්‍රිසීන්ගේ වරප්‍රසාද ලත් පවුල් පැලැන්තීන් කිහිපයක් විසින් 1948 දි මෙරට රාජ්‍ය පාලනය බාර ගන්නා ලද්දේ පෙර පැවති සිංහල රාජ්‍යය යලි ස්ථාපිත කිරීම අරමුණ කොට නොව, ඉංග්‍රීසින්ගේ බෙදා වෙන් කොට පාලනය කිරීමේ රාජ්‍ය පාලනය ක්‍රමය තවදුරටත් පවත්වාගෙන යමින් තමන්ගේ පවුල් පැලැන්තීන්වලට ලබාදුන් වාරප්‍රසාද ආරක්ෂා කර ගැනීම සඳහා විය. ඒ සඳහා ඔවුන් දේශපාලනිකව දෙපිළකට බෙදි 1948 දි සිට අද දක්වා දේශපාලන බලය හුවමාරු කර ගනිමින් සිටි.

1815 සිට ඉංග්‍රිසි අධිරාජ්‍යයේ පැවැත්ම හා ප්‍රගතිය පිණිස පනවා තිබු දැඩි විනය නිති නිසා එකල දේශපාලඥයන්ට ද විනය ගරුකව කටයුතු කිරීමට සිදු විය. එම තත්වය 1948 න් පසු ඩොමිනියන් තත්වය යටතේ ද ආරක්ෂා විය. එහෙත් 1972 ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පසු මෙරට දේශපාලඥයන්ට තමාට රිසිසේ කටයුතු කිරීමට නිදහස උදා විය. ඉන්පසුව ඇති වුයේ රජෙක් නැති අගමැති සහ අමාත්‍ය මණ්ඩලයක් පමණක් ඇති රාජ්‍යයකි. රජෙකු වෙනුවට රජෙකු සංකේතවත් කරන සෙංකෝලයක් භාවිතා කරමින් ඔවුන් වසර පහෙන් පහට වෙනස් කළ හැකි ක්‍රමයක් යටතේ පත් වන නිසා ඔවුන් සියල්ලම කරන්නේ එම වසර පහ තුළ හැකි තරම් රාජ්‍ය සම්පත් අවභාවිතා කිරීමයි. එම තත්වය 1972 දි සුළුවෙන් ආරම්භ වු අතර දැන් රාජ්‍ය සහ ස්වාභාවික සම්පත් අවභාවිතා කිරීමට රජයේ නිලධාරීන් මෙන්ම සාමාන්‍ය ජනයා ද ඒකරාශි කොට ගෙන ඇත. එලෙස කර දියුණුවිම දක්ෂ කමක් ලෙස සමාජය තුළ මතයක් ද ගොඩ නගා, සිංහල ජනතාව දෙපිලක දේශපාලන විෂම චක්‍රයකට අසුකර ගෙන ඇත.

හෙල - සිංහල ඉතිහාසය තුළ 200කට අධික රජවරුන් රට පාලනය කළ ද රට කිසි දිනෙක පිටරටවලට ණය වි රට සංවර්ධනය කළ බවක් ඉතිහාසයේ හෝ ජනප්‍රවාදවල සටහන්ව නැත. ඉංග්‍රිසි පාලනය තුළ දි පවා රට ණය වුයේ නැත. එහෙත් 1948 දි රට බාර ගත් නායකයන් කරන ලද්දේ නවින ලෝකයට සුදුසු නව තාක්ෂණය හා අපනයනය පදනම් කොටගත් නිෂ්පාදන ආර්ථිකයක් ගොඩ නැගීම වෙනුවට, සියල්ල පිටරටින් ආණයනය කිරීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමයි. ඒ සඳහා අද ද මුදල් සොයා ගන්නේ පිටරටින් ණය හෝ ආධාර ලබා ගැනීම, පිටරටවලට ශ්‍රමිකයන් යැවීම, ශ්‍රමය විකුණන විදේශ ආයෝජන, තාවකාලික මුදල් උපයන සංචාරක කර්මාන්තය හා දේශිය තාක්ෂණය දියුණු නොවන එකලස් කර්මාන්ත වලිනි.

ලන්දේසි සමයේ දි දුම්කොළ වගාවන් සඳහා මෙරටට රැගෙන එන ලද දෙමළ වහල් කම්කරුවන්ගේ බෙදුම්වාදයත්, මුස්ලිම් ව්‍යප්තවාදයත් 1948 සිට අද දක්වා ක්‍රමාණුකූලව වර්ධනය වි ඇත්තේ මෙරට භූමියට නිශ්චිත උරුමක්කාර ජාතියක් නැති රටක්විම නිසාය. යම් ඉඩමකට නිශ්චිත උරුමක්කරුවෙකු නැති විට, එම ඉඩමට උරුමයක් නැති පුද්ගලයන් තමන්ට අයත්වන ලෙස ඔප්පු ලියා ගැනිමට උත්සහ කරන්නාක් මෙන්, අද දෙමළ ඊලාම් බෙදුම්වාදීන් සහ ඉස්ලාම් ව්‍යප්තවාදීන් බෞද්ධ පුරාවස්තු විනාශ කරමින් උතුරු සහ නැගෙනහිර ප්‍රදේශවල උරුමයක් සාදා ගනිමින් සිටි.

එවැනි උත්සහයන්ට බහුජාතික, බහුවාර්ගික, බහුආගමික, මානව හිමිකම්, විවිධත්වය තුළ එකමුතුකම යන සංකල්පවලින් සහ සියළු ජාතීන්ට සම අයිතිය යන සංකල්පවලින් රැකවරණය ලබා දි ඇත. සිංහලයන් තම ජාතික අයිතිය ගැන කථා කිරීම ජාතිවාදයක් ලෙස හංවඩු ගසා වසර පහෙන් පහට බලය ලබා ගෙන රටේ සම්පත් අවභාවිතා කරන සහ දෙමළ මුස්ලිම් ඡන්ද මත යැපෙන දේශපාලඥයන්ව ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකින් ආරක්ෂා කොට ඇත. එම නිසා ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංකල්පය ආරක්ෂා කරන තවත් ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් නිතිගත කිරීමෙන් දෙමළ බෙදුම්වාදීන්ට සහ මුස්ලිම් ව්‍යප්තවාදීන්ට සිංහල ජාතිය අභිබවා සුවිශේෂි වරප්‍රසාද හා නීති මගින් තම තමන්ගේ ඉලක්ක කරා යාමට අවශ්‍ය කාලපරාසය, නීතිමය රැකවරණය සහ ජාත්‍යයන්තර පිළිගැනීම ද ලැබෙන්නේය.

# නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් නීතිගත කිරීමේ ක්‍රමවේදය

නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීම සඳහා වත්මන් ආණ්ඩුව විසින් විශේෂඥ කමිටුවක් පත් කර ඇති අතර මහජන අදහස් ලබා ගැනීම 2020 දෙසැම්බර් 31 වෙනිදායින් අවසන් විය. එම කමිටුවේ මූලික කෙටුම්පත 2021 මාර්තු මස 31 වෙනිදා ආණ්ඩුවට ඉදිරිපත් කිරීමට නියමිතය. ඉන්පසුව රජයට අවශ්‍ය වෙනස්කම් එම කෙටුම්පතට සිදු කොට කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කොට අනුමැතිය ලබා ගත් පසු නීතිපති දෙපාර්තමේන්තුවට යවා අවසාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා පනත් කෙටුම්පත පිළියෙල කොට ප්‍රසිද්ධ කිරීමෙන් පසු එම කෙටුම්පත පාර්ලිමේන්තුවේ න්‍යාය පුස්තකයට ඉදිරිපත් කිරීම පනත් කෙටුම්පත් පිළිබඳව සාමාන්‍ය ක්‍රමවේදයයි. ඉන්පසුව සතියක් ඇතුලත එම පනත් කෙටුම්පත ජනමතවිචාරණයකට යොමු කළ යුතු ද නැද්ද යන ප්‍රශ්නය නිරාකරණය කර ගැනිම සඳහා ඕනෑම පුද්ගලයෙකුට ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් ඉදිරිපත් කළ හැකිය. එහෙත් රජය නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා පනත් කෙටුම්පත ජනමතවිචාරණයකට යොමු කරන බව නිල වශයෙන් ප්‍රකාශයට පත් කොට ඇත්නම් ඒ බව සනාථ කරවා ගැනීම සඳහා පෙත්සමක් ඉදිරිපත් කළ හැකිය.

ජනමතවිචාරණයක දි සිදුවන්නේ බලයේ සිටින ආණ්ඩුව විසින් ඉදිරිපත් කරන ජාතික වැදගත්කමකින් යුත් ප්‍රශ්නයකට ආණ්ඩුව බලාපොරොත්තු වන ආකාරයේ අනුමැතියක් ජනතාවගෙන් ලබා ගැනීමට උත්සහ කිරීමයි. ඒ සඳහා ඡන්ද ලකුණු දෙකක් ඉදිරිපත් කෙරෙන අතර ලාම්පුව ලකුණට ඉදිරියෙන් කතිරය සලකුණ කිරීමෙන් ආණ්ඩුව ඉදිරිපත් කෙරෙන නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ජනතා කැමැත්තත්, කළගෙඩිය ඉදිරියෙන් කතිරය සලකුණු කිරීමෙන් එයට අකමැත්තත් ප්‍රකාශවේ. ජනමතවිචාරණයක් ජනාධිපති මැතිවරණයකට සමාන වන අතර 50% ක් සහ එක් ඡන්දයක් ලැබෙන සලකුණු ජයග්‍රහණය කරන්නේය. ජනමතවිචාරණයක දි ප්‍රචාරක කටයුතු කිරීම සඳහා පිළිගත් දේශපාලන පක්ෂ ආණ්ඩුවේ ප්‍රශ්නයට පක්ෂව වන බවට හෝ විරුද්ධ වන බවට මැතිවරණ කොමිසමට දන්වා ලියාපදිංචි විය යුතුය. ජනමතවිචාරණය සති හතරක කාලයකට පමණක් සීමා වන අතර ඒ ඒ පක්ෂවලින් ඡන්දපොළ හා ගණන් කිරීමේ නියෝජිතයන් පත් කළ හැකි වන්නේය.

මෙහිදි සිංහලදීප ජාතික පෙරමුණේ ස්ථාවරය පහත සඳහන් යෝජනා සියල්ලම නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුලත් කල යුතු බවයි. ඒ අනුව එම යෝජනා නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුලත් කරන්නේ නම් සමස්ත නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවටම 1948 සිට සිදු නොවු ව්‍යුහාත්මක වෙනසක් සිදු වන්නේය. ආණ්ඩුව එසේ කරන්නේ නම් එම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පක්ෂව අප ප්‍රචාරක කටයුතු කරන්නේය. එහෙත් ඉහත පැහැදිලි කරන ලද ආකාරයට පවත්නා ආණ්ඩුවේ සහ විපක්ෂයේ දේශපාලන පක්ෂවල දැනට ඇති දේශපාලන ස්ථාවරය වන්නේ වාර්ගික පදනමක් මත කලාප බෙදා වෙන් කළ පාලන ක්‍රමය තවදුරටත් පවත්වාගෙන යමින් මෙරට වෙසෙන සියළු ජනකොට්ඨාශවලට සාමන ජාතිකත්ව අයිතිය යන සංකල්පය පවත්වාගෙන යාමයි. සිංහල ජාතියට වසර 2300කට අධික කාලයක් තිබු ඓතිහාසික ජාතික අයිතිය යලි ලබා දීමට කටයුතු කරාවි යයි කියා දැනට තිබෙන තත්වය අනුව සිතා ගැනීම අපහසුය.

එම නිසා අප අපේක්ෂා කරන කරන පරිදි 1815ට පෙර සිට සිංහල ජාතියට ඓතිහාසිකව තිබු අයිතිය යලි ලබාදීමට රජය කටයුතු නොකළහොත් ඒ සඳහා සිංහල ජාතිය වෙනුවෙන් විකල්පයක් අප සූදානම් කරමින් සිටි. එනම් අප පක්ෂය ද විද්වත් කමිටුවක් මගින් ඉහත සඳහන් යෝජනා ඇතුලත් නව අණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතක් සකස් කරමින් පවති.

ඉහත සඳහන් කළ ආකාරයට නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් නීතිගත කිරීමට පාර්ලිමේන්තුවේ 2/3 ක ඡන්දයට අමතරව ජනමතවිචාරණයක දි 50% ක ඡන්දයක් වත්මන් ආණ්ඩුවට ලබා ගත හැකි නිසා පවතින තත්වය යටතේ ආණ්ඩුවට අවශ්‍ය නම් තවත් ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් නිතිගත කර ගත හැකිය. මෙහි දි අප පක්ෂයට පාර්ලිමේන්තුවේ නියෝජනයක් හෝ නැති තත්වයක් යටතේ සිංහල ජාතිය වෙනුවෙන් අපට කල හැකි වන්නේ රජයේ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව එළිදැක්විමට පෙර අප පක්ෂයේ සිංහල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංකල්පය පිළිබඳව පුළුල් මහජන මතයක් ගොඩ නැගීමයි. එවැනි ප්‍රබල මතයක් ගොඩ නැගීමට අපහට හැකි වුවහොත් අපගේ ඊලග පියවර වන්නේ ආණ්ඩුව තවත් ජනරජ අණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් නීතිගත කිරීමට උත්සහ කළහොත් අපගේ සිංහල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පත එළි දක්වා රජයේ යෝජිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පත සමග සිංහල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පත ද ජනමතවිචාරණයකදි ඉදිරිපත් කරන ලෙස මහජන මතයක් ගොඩ නැගීමයි. ඒ සඳහා ජනමතවිචාරණ පනත සංශෝධනය කිරීමෙන් කළ හැකි වන අතර නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්මත කිරීම ජාතික වැදගත්කමින් යුත් ප්‍රශ්නයක් පමණක් ලෙස සලකා පාර්ලිමේන්තුවේ 2/3 ක අවශ්‍යතාවය නොසලකා කටයුතු කළ යුතු වන්නේය. ප්‍රබල මහජන මතයක් ඉදිරියේ ආණ්ඩුවට සහ විපක්ෂයට එය කිරීමට සිදුවන්නේය.

ඉහත තත්වයක් යටතේ ත්‍රෛනිකායික මහනායක ස්වාමින් වහන්සේලාගේ ආශිර්වාදය සහ බහුතර සිංහල ජනතාවගේ ඡන්දය ලැබුනහොත් වසර 72 කට අධික කාලයක් ඉදිරියට යන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ක්‍රමය අවසන් කොට සිංහල ජාතියේ ඓතිහාසික අයිතිය යලි ලබා දෙන සිංහල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් නිතිගත කර ගත හැකි වන්නේය.

# සිංහල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සඳහා ප්‍රධාන යෝජනා වත්මන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ වගන්තිවල ඇති අංක පිළිවෙළට හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක සඳහන් විය යුතු ආකාරයට

ජාතික රාජ්‍යය
1. සිංහලද්වීපය නිදහස්, ස්වෛරී, ස්වාධීන සිංහල ජාතික රාජ්‍යයකි. සිංහලද්වීපය, සිංහලද්වීප ජාතික රාජ්‍යය යනුවෙන් හඳුන්වනු ලැබේ.

ඒකීය ජාතිය, ඒකීය රාජ්‍යය සහ ජාතිකත්වය
2. සිංහලද්වීපය ඒකීය සිංහල ජාතික රාජ්‍යයකි. සිංහලද්වීපයේ ජාතිකත්වය, සිංහලද්වීප ජාතිකත්වය ලෙස හැඳින්විය යුත්තේය.

ජනතාවගේ පරමාධිපත්‍යය
3. සිංහලද්වීපයේ පරමාධිපත්‍යය ජනතාව කෙරෙහි පිහිටා ඇත්තේය. පරමාධිපත්‍යය අත්හල නොහැක්කේය. අන් සතු කළ නොහැක්කේය. පරමාධිපත්‍යයට ඓතිහාසික සිංහල රාජ්‍යයේ ආධිපත්‍ය බලය, රජයේ පාලන බලය, මූලික අයිතිවාසිකම් සහ ඡන්ද බලය ද ඇතුළත් වන්නේය.

පරමාධිපත්‍යය ක්‍රියාත්මක කිරීම

4. සිංහලද්වීප ජනතාවගේ පරමාධිපත්‍යය ක්‍රියාත්මක වීම ද, භුක්ති වීම ද මතු දැක්වෙන ආකාරයෙන් සිදු වන්නේය :-

(අ). ඓතිහාසික සිංහල රාජ්‍යයේ ආධිපත්‍ය බලය, ත්‍රෛනිකායික මහනායක හිමිවරුන් විසින් සාමූහිකව ක්‍රියාත්මක කරන්නේය, ඒ අනුව, ජාතික රාජ්‍ය සභාව විසින් අනුමත කරන ලද සියළුම නීතිමය කෙටුම්පත්, ව්‍යවස්ථා සංශෝධන අනුමත කිරීම හෝ නොකිරීම සහ ඓතිහාසික සිංහල ජාතියේ සහ රාජ්‍යයේ පැවැත්මට අහිතකර ජනාධිපතිවරයාගේ, ජාතික රාජ්‍ය සභාවේ තීරණ හෝ අධිකරණයේ තීන්දු නිශ්ප්‍රභා කිරීම තුළින් ක්‍රියාත්මක කළ යුත්තේය;

(ආ). ජනාධිපතිවරණයක දී ජනතාව විසින් තෝරා පත් කර ගනු ලබන ජනාධිපති විසින් සිංහලද්වීපයේ ආරක්ෂාව ඇතුළු ජනතාවගේ විධායක බලය ක්‍රියාත්මක කළ යුත්තේය;

(ඇ). ජනතාවගේ ව්‍යවස්ථාදායක බලය ජනතාව විසින් තෝරා පත් කර ගනු ලබන මන්ත්‍රීවරුන්ගෙන් සමන්විත ජාතික රාජ්‍ය සභාව විසින් සහ ජනතාව විසින් ජනමතවිචාරණයකදී ක්‍රියාත්මක කළ යුත්තේය;

ජාතික කොඩිය
6. සිංහලද්වීප ජාතික රාජ්‍යයේ ජාතික කොඩිය වන්නේ දෙවන උප ලේඛණයේ දැක්වෙන 1815 දී කන්ද උඩරට ඓතිහාසික සිංහල රාජධානියේ භාවිතා කරන ලද සිංහ කොඩිය වන්නේය.

බුද්ධාගම
9. (අ) සිංහලද්වීපයේ රාජ්‍ය ආගම බුද්ධාගම වන්නේය. සිංහලද්වීපයේ බුද්ධාගම හා බුද්ධ ශාසනය සුරක්ෂිත කොට පෝෂණය කිරීම සහ බෞද්ධ පුරාවස්තු ආරක්ෂා කොට සංරක්ෂණය කිරීම ද රජයේ වගකීම වන්නේය. සිංහලද්වීපයේ අනෙකුත් ආගම් සහ ලබ්ධීන්ට සාමකාමීව ඇදහීමේ අයිතිය රජය ආරක්ෂා කරන්නේය. එසේ වුව ද, කිසිම ආගමක හෝ ලබ්ධියක අනුගාමිකයන් විසින් සිංහලද්වීපයේ බුද්ධාගමට හෝ බුද්ධ ශාසනයට හිමි ස්ථානයට හානි නොවන අයුරින් කටයුතු කළ යුතු වන්නේය.

ජාතික සහ රාජ්‍ය භාෂාව
18. සිංහලද්වීපයේ ජාතික සහ රාජ්‍ය භාෂාව සිංහල භාෂාව වන්නේය.

ජාත්‍යන්තර සම්බන්ධීකරණ භාෂාව
19. ඉංග්‍රීසි භාෂාව ජාත්‍යන්තර සම්බන්ධීකරණ භාෂාව වන්නේය.

<u>අමතර යෝජනා</u>
සය වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය -
6 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ අඩංගු වෙනම රාජ්‍යයක් බිහි කිරීමේ අරමුණට අමතරව පෙඩරල්, සංඝීය, සහසංඝීය හෝ එක්සත් රටක් යන සංකල්ප ද තහනම් කළ යුතුය.

පළාත් සභා ක්‍රමය -
පළාත් සභා ක්‍රමය අහෝසි කළ යුතුය. 1987 ට පෙර තිබූ දිස්ත්‍රික් ඒජන්තවරයාගේ බලය වත්මන් තත්වයට ගැලෙපෙන පරිදි සංශෝධනය කොට යලි ලබා දිය යුතුය. දෙමළ සහ ඉස්ලාමීය බෙදුම්වාදීන්ට වාර්ගික පදනම දේශපාලන විසඳුම් ලබාදීමට හෝ වෙන මොන යම් හේතුවක් මත හෝ දේශපාලන බලය බෙදීම නොකළ යුතුය.

වත්මන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇති සෙසු පරිච්ඡේද සුළු වෙනස්කම් සහිතව සිංහල අණෝඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුලත් කළ හැකි වන්නේය.

---

සිංහලද්වීප ජාතික පෙරමුණේ ප්‍රකාශනයකි
කුරුණෑගල අස්ලිය ප්‍රින්ටර්ස් හි මුද්‍රණය කොට ප්‍රසිද්ධ කරන ලදී.
sinhaladeepajp@gmail.com 31. 01. 2021